## සංක්ෂිප්තය

දීර්ඝ කාලපරිච්ඡේදයක් ස්ථාවර මට්ටමක පැවති රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන, සමාජ, සංස්කෘතික රටාවල එක් පැතිකඩක් නිරූපණය කරන රෝහණ දේශය පිළිබඳ ජාතික ඉතිහාසතලයේ මූලාශ්‍ර ඉදිරිපත් කර ඇති කරුණු සංක්ෂිප්ත ස්වභාවයක් ගනී. අගනගරයේ රචිත සාහිත්‍ය මූලාශ්‍ර නිහඬතාව එල කරන ක්ෂේත්‍ර පිළිබඳව අභිලේඛන මගින් ලබා ගත් සාක්ෂි ද උපයෝගී කරගෙන දිවයිනේ ප්‍රමුඛ උපරාජ්‍යය වූ රෝහණ දේශයේ ජීවත් වූ මානවයින් උදෙසා රාජ්‍ය පාලනයේ පැවති නිදහස්කම් හා මනුෂ්‍ය ගරුත්වය පිළිබදව නෛතික ප්‍රතිපත්ති මෙම අධ්‍යයනයේ දී විමර්ශනයට ලක් විය. රෝහණ දේශයේ ක්‍රියාත්මක වූ මානව අයිතිවාසිකම් පිළිවෙත මෙහිදී පරීක්ෂණයට භාජනය විය. රජරට ශිෂ්ටාචාර සමයෙහි ලියැවුණු සාහිත්‍ය මූලාශ්‍ර හා අභිලේඛන මූලාශ්‍ර පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය කිරීමෙන් ලබා ගත් සාක්ෂි අන්තර්ගත විශ්ලේෂණයට භාජනය කරමින් අපගේ අධ්‍යයනය සිදු කරන ලදි. නූතන මානව අයිතිවාසිකම් සංකල්පය පිළිබදව සිදු කර ඇති අධ්‍යයන මගින් මෙම සංකල්පය නූතන ජාතික රාජ්‍යය සංකල්පයට පසුව ඇති වූ සංකල්පයක් ලෙස දැක්වීමේ පොදු නැමියවක් හඳුනාගත හැකි වේ. නමුත් මෙම අධ්‍යයනයේදී යුරෝපයේ මානව අයිතිවාසිකම් පිළිබදව සාකච්ඡා කිරීමට සියවස් ගණනාවකට පෙර ශ්‍රී ලංකාවේ රාජ්‍යය පාලන ප්‍රතිපත්ති හා නෛතික ප්‍රතිපාදනවල මානව අයිතිවාසිකම්වල මූල බීජ හා විකාශන අවස්ථා දැකිය හැකි බව පෙන්වා දී ඇත. රජරට රාජධානි සමයේ පැවති ආගමික දර්ශනය හා රාජ්‍යය ප්‍රතිපත්ති පොදු මනුෂ්‍යභාවය හා මානව ගරුත්වය පිළිබදව දක්වන ලද ඉහළ සැලකිලිමත්භාවය රෝහණ දේශයේ මානව අයිතිවාසිකම් පිළිවෙතක් ඇති වීමට තුඩු දුන් අන්දම මූලාශ්‍රගත සාක්ෂි විවරණය කරමින් මෙහිදී විමර්ශනය කරන ලදි. නූතන මානව අයිතිවාසිකම් සංකල්පයට සමාන්තර මානව අයිතිවාසිකම් පිළිවෙතක් රෝහණ දේශයේ ක්‍රියාත්මක වී ඇති බව මෙම අධ්‍යයනය මගින් හඳුනා ගන්නා ලදි. ජීවත්වීමේ අයිතිය, කෲර අමානුෂික වධ හිංසාවලින් මිදීමට තිබූ අයිතිය, නීතියේ රැකවරණය හා සර්ව සාධාරණත්වය ඇතුළු නූතන මානව අයිතිවාසිකම් සංකල්පයේ පළමු පරම්පරාවේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පෞරාණික රෝහණ දේශයේ ක්‍රියාත්මක වූ බව තහවුරු වේ. එමෙන්ම සමාජ, සංස්කෘතික හා ආර්ථික අයිතිවාසිකම් මෙන්ම සහශ්‍ර සංවර්ධන මානව අයිතිවාසිකම් ඉලක්ක වූ සංවර්ධනය ජීවත් වීමට යහපත් පරසරය වැනි මානව අයිතිවාසිකම් පවා රෝහණ දේශයේ ඉතිහාසයේ දක්නට ලැබීම සුවිශේෂී කරුණකි. මානව අයිතිවාසිකම් පිළිවෙත සුරක්ෂිත කිරීමේ නෛතික ක්‍රියාවලියක් ද රජරට රාජධානි සමයෙහි රෝහණ දේශයේ පැවති බව මෙම අධ්‍යයනයේ දී හඳුනා ගන්නා ලදි. එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයෙහි දැක්වෙන පොදු මනුෂ්‍යභාවය හා මානව ගරුත්වය පිළිබඳ අයිතිවාසිකම්වලින් සැළකිය යුතු ප්‍රමාණයක් අපගේ අධ්‍යයන කාලසීමාවේ රෝහණ රාජ්‍යයේ පැවති බව තහවුරු විය. ප්‍රාදේශීය ඉතිහාසය ජාතික ඉතිහාසයට බද්ධ කිරීමේ වැදගත්කම කේන්ද්‍රීය සංකල්පයක් ලෙස භාවිත කරමින් සිදු කළ මෙම අධ්‍යයනය මගින් යුරෝපයේ මානව අයිතිවාසිකම් පිළිබද කතිකාවට පෙර එහි මූලබීජ ශ්‍රී ලංකාවේ පැවති බව නිරීක්ෂණය විය.